**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2015

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

---

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

A කොටස අනිවාර්ය ප්‍රශ්න 8 කින් සමන්විතය. මේ සඳහා සම්පූර්ණ ලකුණු 20 කි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ දැනුම, ලාභ නොලබන ආයතනවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ දැනුම සමග සමුච්චිත අරමුදල, එකතු කළ අගය මත බදු සම්බන්ධ ගැටළු, තනි පුද්ගල ව්‍යාපාර පිළිබඳ අවබෝධය සහ අවසාන තොග පිළිබඳ ගැටළු වලට අවධානය යොමු කරමින් අයදුම්කරුවන්ගේ දැනුම විමසා ඇත. එසේම හවුල් ව්‍යාපාර පිළිබඳ ප්‍රාථමික දැනුම හා ආශ්‍රිත පනත් කෙරෙහි දැනුම විමසා ඇත.

අවබෝධය හා දැනුම ඇති වැඩි දෙනෙක් ප්‍රමාණවත් ලකුණු උපයාගෙන ඇත. අයදුම්කරුවන්ගේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ දැනුම ඉතා දුර්වලය. ඒ සම්බන්ධයෙන් යොමුව තිබූ 1.3 ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වැඩි දෙනෙක් තෝරා නොතිබුණි. අවසාන තොග අගය සෙවීමේ 1.8 ප්‍රශ්නයට ද නිවැරදි පිළිතුර ලබා දීම මග හැර ඇත. වංචා වැළැක්වීමේ ආඥා පනතට අනුව හවුල් ගිවිසුමක අවශ්‍යතාවය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම දුර්වල බව අනාවරණය විය. අයදුම්කරුවන් විසින් ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ දැනුම හා ගණකාධිකරණ සංකල්ප පිළිබඳව මූලික දැනුම වැඩි දියුණු කරගත යුතුය.

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම විමසීම සඳහා මෙම ප්‍රශ්නය සකස් කර තිබුණි. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් බහුතරයක් විසින් සපයන ලද පිළිතුරු ඉතාමත් සාර්ථක මට්ටමක පැවති අතර අසාර්ථක පිළිතුරු සැපයූ අතලොස්සක් ද වූහ. පිළිතුරු පත්‍ර ඇගයීමේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දක්වා ඇත:

(1) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් වූ චෙක්පත් වල අගය මුදල් පොතේ ශේෂයට එකතු නොකිරීම.

(2) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකම අඩු නොකිරීම.

(3) මූලික න්‍යායික දැනුම තහවුරු කරගෙන නොමැති කමින් මුදල් පොතේ ශේෂය ගලපා නිවැරදි ශේෂය බැංකු සැසඳුමට ගෙන ඒම අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් සිදුකර නොතිබුණු අතර එම ගැලපීම බැංකු සැසඳුම් ප්‍රකාශය තුළම දක්වා තිබුණි. කෙසේ නමුත් සමස්ථයක් ලෙස ගත්විට ප්‍රමාණවත් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් සංඛ්‍යාව සෑහීමට පත්විය හැකි මට්ටමක විය.

## ප්‍රශ්න අංක 03

මෙය පොදු ලෙජරයේ ලැබිය යුතු පාලන ගිණුමේ ශේෂය, ලැබිය යුතු ලෙජර් ගිණුමේ ශේෂය සමග සැසඳීම සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමු කළ ප්‍රශ්නයකි. ලැබිය යුතු පාලන ගිණුම පිළියෙල කර සාර්ථකව ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් සමත් විය. ලැබිය යුතු පාලන ගිණුමේ ශේෂය සැසඳීම සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් අයදුම්කරුවන්ට නොවීය. අයදුම්කරුවන්ගේ දැනුම පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුම හා ලැබිය යුතු ලෙජරයේ ණයගැති ගිණුමට (individual account) පමණක් සීමා වී ඇති බව දෙන ලද පිළිතුරු වලින් සනාථ විය.

## ප්‍රශ්න අංක 04

අත්පත් කරගත් යන්ත්‍රයේ ධාරණ අගය සහ වර්ෂයේ ක්ෂය ගණන් බැලීම පිළිබඳව වූ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය යොමු වී තිබුණි. ස්ථාවර වත්කම්හි පිරිවැය ගණන් බැලීම හා ක්ෂය ගණනය සම්බන්ධයෙන් දැනුම උරගා බැලීමට යොමු කළ මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු ලබාගත් අයදුම්කරුවන් සංඛ්‍යාව ඉතාමත් සීමිත ය. කෙසේ නමුත් වෙන්කර තිබූ මුළු ලකුණු වලින් අඩකට වඩා ලබා ගැනීමට වැඩි දෙනෙක් සමත් විය. ප්‍රශ්නය අවබෝධයෙන් කියවා පිළිතුරු සපයා නොමැති බව දක්නට ලැබුණු අතර පිළිතුරු ඉදිරිපත් කර තිබූ ආකාරයද ඉතා දුර්වලය. අසන ලද ප්‍රශ්නයට ඍජු පිළිතුරු සපයා නොමැත. පිරිවැය ගැළපීම හා අදාල දිනයට ක්ෂය ගණනය කිරීම පිළිබඳ දැනුම වර්ධනය කරගත යුතුය.

## ප්‍රශ්න අංක 05

මූල්‍ය ප්‍රකාශන දිනට දෙන ලද හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් තීරු ක්‍රමයට පිළියෙල කිරීම සම්බන්ධ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය යොමු කර තිබුණි. ඉතාමත් සරල ගැටළුවක් වුවද වෙන් කරන ලද මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් වූයේ අයදුම්කරුවන්ගෙන් කිහිප දෙනෙකු පමණි. අයදුම්කරුවන් බහුතරයක් වරදවාගෙන තිබුණේ හවුල් ව්‍යාපාරයේ ලාභය විසර්ජනය කිරීමයි. ඇතැම් අයදුම්කරුවන් අවබෝධය නොමැතිකම නිසා හවුල්කරුවන්ගේ ගැතිලි ද ලාභ විසර්ජන ප්‍රකාශයට ගලපා තිබුණි.

## ප්‍රශ්න අංක 06

මෙයද හවුල් ව්‍යාපාර සම්බන්ධ ප්‍රශ්නයකි. මෙහිදී නව හවුල්කරුවෙකුගේ පැමිණීම හේතුවෙන් පැවති ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතයේ වෙනස්වීම, පැරණි හවුල්කරුවන් ඔවුන්ගේ ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය කැපකිරීම සහ නව හවුල්කරු විසින් හවුල් ව්‍යාපාරයට රැගෙන ආ යුතු ඔහුගේ කොටස ගණනය කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම විමසීම අපේක්ෂිතය. මෙහිදී නව ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් නිවැරදිව ගණනය කර තිබුණ ද කැපකළ අනුපාතය නිවැරදිව ගණනය කර තිබුණේ අයදුම්කරුවන්ගෙන් අතලොස්සක් පමණි. **රීන්** විසින් හවුල් ව්‍යාපාරයට ගෙන ආ යුතු කොටස කීර්තිනාම කොටස ද ඇතුලත්ව ගණනය කිරීමට ප්‍රශ්නයේ උපදෙස් දී තිබුණ ද බහුතරයක් අයදුම්කරුවන් ඒ පිළිබඳව සැලකිලිමත් නොවී එය වරදවාගෙන තිබුණි.

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශය සහ ලාභා'ලාභ විසර්ජන ගිණුම පිළියෙල කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය යොමු වී තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් වෙන්කර තිබූ මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් විය. එසේම, මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සියලුම දෙනාම පිළිතුරු සපයා තිබුණි. කෙසේ නමුත් අතලොස්සක් අයදුම්කරුවන් විසින් නිවැරදි ආකෘතිය භාවිත කර නොතිබුණි. එසේම, ලාභා'ලාභ විසර්ජනය ගිණුමේ පෙන්විය යුතු හවුල්කරුවන්ගේ වැටුප් සමහරුන් ලාභා'ලාභ ගිණුමේ (ආදායම් ප්‍රකාශයේ) පෙන්වා තිබුණි. එසේම, ප්‍රශ්නය හොඳින් කියවීමෙන් තොරව හවුල් ව්‍යාපාරයේ ශේෂ පත්‍රය, ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කිරීමට ඇතැම් අයදුම්කරුවන් පෙළඹී ඇති අතර, ඒ නිසා වටිනා කාලය අනවශ්‍ය ලෙස වැය කර තිබුණි.

### ප්‍රශ්න අංක 08

ක්‍රීඩා සමාජයක සාමාජික දායක මුදල් ගිණුම සහ යාවජීව සාමාජික ගාස්තු ගිණුම පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත. 2014 වර්ෂයේ සාමාන්‍ය සාමාජික ගාස්තු ආදායම, ලද සාමාන්‍ය සාමාජික ගාස්තු, 2013 සහ 2014 වර්ෂයන් සඳහා හිඟව ඇති සාමාන්‍ය සාමාජික ගාස්තු, 2014 වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගත යුතුව ඇති යාවජීව සාමාජික ගාස්තු ප්‍රමාණය පෙරවැඩ සමග පැහැදිලිව ගණනය කර පෙන්වීමද මීට ඇතුලත් විය. අයදුම්කරුවන් වැඩි දෙනෙක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොතිබුණි. සමිති සමාගම් ගිණුම් සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම ඉතාමත් අවම මට්ටමක පවතින බව සනාථ විය. එසේම, පිළිතුරු සපයන ලද අයදුම්කරුවන් පවා ලබා ගත් ලකුණු ඉතාමත් පහළ මට්ටමක පැවතුණි. ප්‍රශ්නයේ විශේෂයෙන්ම සඳහන් කර තිබුණ ද බහුතරයක් අයදුම්කරුවන් විසින් පෙරවැඩ පැහැදිලිව ඉදිරිපත් කර නොතිබුණි. අවශ්‍ය කෙරෙන ගිණුම් පිළියෙල කර තිබුණ ද ගැලපුම් නිවැරදි නොවන නිසාත් පෙරවැඩ පෙන්වා නොමැති නිසාත් අයදුම්කරුවන්ගෙන් බහුතරයකට මෙම ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

### ප්‍රශ්න අංක 09

(a) ජංගම වගකීමක් වීමට සපුරා ලිය යුතු නිර්ණායක 4 ක් සඳහන් කර ඉතාමත් පහසුවෙන් ලකුණු ලබාගැනීමේ හැකියාව තිබුණ ද වැඩි දෙනෙකුට එම ලකුණු ලබා ගැනීමට අසීරු විය. අවබෝධයෙන් යුතුව ප්‍රශ්න පත්‍රය නොකියවීම නිසා මෙම කොටස මගහැරී ගිය බවක් දක්නට විය. ඉදිරිපත්ව තිබූ පිළිතුරු ද ඉතාමත් අසාර්ථකය.

(b) විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම වෙනුවෙන් ලකුණු 8 ක් වෙන් කර තිබුණි. මෙහිදී සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවක භාර අරමුදල (ETF) ගණනය කිරීම සම්බන්ධයෙන් ඉතාමත් අසාර්ථක පිළිතුරු සපයා තිබුණි. සම්මත අනුපාතයන්ට දායක මුදල් ගණනය කර නොතිබුණි. මෙම ගැලපුම නිවැරදිව ගණනය නොකිරීම නිසා එම ගැලපුමට අදාල ලකුණු අයදුම්කරුවන්ගෙන් බහුතරයකට අහිමි විය. සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිශතය 14% ක් ලෙස වරදවා ගණන් ගත් අයදුම්කරුවන් ද විය. විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී ආරම්භක හා අවසාන තොග නිවැරදිව ගෙන නොතිබුණි. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කිරීමට අදාල ආකෘතිය නොදැන සිටීම සහ නිවැරදි අවබෝධයක් නොමැති වීම නිසා පහසුවෙන් ලබා ගත හැකිව තිබූ ලකුණු ලබා ගැනීමට නොහැකි විය. ප්‍රශ්නයට අදාලව අවශ්‍ය දෑ පිළියෙල කිරීමට අමතරව අයදුම්කරුවන් විසින් අනවශ්‍ය දෑ එනම් ගිණුම් පිළියෙල කිරීම වැනි දෑ නිසා කාලය අපතේ ගොස් තිබුණි. ප්‍රශ්නය කියවා බලා නිවැරදිව තේරුම් නොගැනීම නිසා ශේෂ පත්‍රය පවා ඇතැම් අයදුම්කරුවන් පිළියෙල කර තිබීම උදාහරණ වශයෙන් දැක්විය හැකිය. දුන් වට්ටම් සහ ලද වට්ටම් නිවැරදිව ආදායම් ප්‍රකාශයේ පෙන්වීමට දැනුම නොමැති අයදුම්කරුවන් පවා විය.

# D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

(a) මෙම ප්‍රශ්නයෙන් ස්කන්ධ කොටස් නිකුත් කිරීමේ වාසි 3 ක් සඳහන් කිරීමට විමසා තිබුණි. කෙසේවෙතත්, පෙර පරිදිම ප්‍රශ්නයේ (b) කොටසට වැඩි අවධානයක් යොමු කිරීම නිසා බොහෝ අයදුම්කරුවන්ට මෙම කොටස මගහැරී ඇත. ලියා තිබූ පිළිතුරුද එතරම් සාර්ථක නොවීය. සාර්ථකව පිළිතුරු සපයා වෙන්කරන ලද මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් වූයේ අයදුම්කරුවන්ගෙන් ඉතාමත් සුළු පිරිසක් පමණි. පොතපත දැනුමින් පමණක් නොව උපකල්පන මත පදනම්ව විවිධ නිවැරදි නොවන කරුණු සඳහන් කිරීමට පිළිතුරු සපයන ලද කිහිප දෙනෙක් පෙළඹී තිබුණි.

(b) සීමිත පෞද්ගලික සමාගම් සම්බන්ධයෙන් කළමනාකරණයේ භාවිතය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම මැනීම මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු විය. බොල් ණය හා අඩමාන ණය ගැලපීම, උපචිත වියදම් ගැලපීම, තොග හානි ගැලපීම, වත්කම් ක්ෂය ගැලපීම, ආදායම් බදු ගැලපීම සහ සේවක වන්දි ගෙවීම ගණනය හා හඳුනා ගැනීම ආදී ගැටළු ඇතුලත් කර ඒවා ගිණුම් තැබීම සම්බන්ධයෙන් මෙම ප්‍රශ්නය යොමු වී තිබුණි. අයදුම්කරුවන් බොහොමයක් දෙනා මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණ ද ඇතැම් අයදුම්කරුවන් කොටස් හිමියන්ට ඉදිරිපත් කරන ආකාරයට ගිණුම් පිළියෙල කර තිබීමෙන් පෙනී යන්නේ වැඩි දෙනෙකුට කළමනාකරණය සඳහා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැති බවයි. එසේම, නියමිත ආකෘතියට සහ රටාවට අනුව පිළිතුරු ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් අසමත්ව ඇත. කෙසේනමුත් බහුතරයක් අයදුම්කරුවන් වෙන්කළ ලකුණු ප්‍රමාණයෙන් අඩකට වඩා ලබා ගැනීමට සමත් විය. එසේම, මුළු ලකුණු ප්‍රමාණයම උපයා ගත් අයදුම්කරුවන් ද සැලකිය යුතු ප්‍රමාණයක් සිටියහ.

ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ මූලික දැනුම නොමැති වීම අයදුම්කරුවන්ගේ පොදු දුර්වලතාවයක් විය. ගණනය කළ දළ ලාභය, බහුතරයක් අයදුම්කරුවන්ගේ නිවැරදි නොවීය. සේවක වන්දි පිළිබඳ සටහන්, ක්ෂය ගැලපීම් සහ ආදායම් බදු පිළිබඳ ගැලපුම් ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කිරීම ප්‍රශ්නයේ අරමුණ වුවද බහුතරයක් අයදුම්කරුවන් එම ගැලපුම් නිවැරදිව සටහන් කර නොතිබුණි. ඉදිරිපත් කළ යුතු ආකාරයට බොහෝ අයදුම්කරුවන් නිසියාකාරව ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. පෙරවැඩ නිවැරදිව සිදු කර අදාල අගයන් ආදායම් ප්‍රකාශයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නිසි ස්ථානයන්හි පෙන්වීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය. මූල්‍ය තත්ත්වය වෙනස්වීමේ ප්‍රකාශය ප්‍රශ්නයෙන් ඉල්ලා නැතත් සමහරු එයද ඉදිරිපත් කිරීමට පෙළඹීමෙන් කාල කළමනාකරණය අමතක කර තිබුණි. එසේම, ආදායම් ප්‍රකාශයේ පෙන්වනු ලබන ඇතැම් අගයන්ට අදාලව පෙරවැඩ නිවැරදිව පෙන්විය යුතුය.

උදා: විකුණුම් හා බෙදාහැරීමේ වියදම් ලෙස එක් අගයක් පමණක් පෙන්වා පෙරවැඩ නොදැක්වීම හේතුවෙන් දෙන ලද අගයෙහි කිසියම් වරදක් සිදුවුවහොත් එහි ඇතුලත් අනෙකුත් අගයන්ට වෙන් කළ ලකුණු පවා අහිමි වීම.

අයදුම්කරුවන් විසින් තවදුරටත් ගිණුම්කරණ මූලධර්ම, නව ගිණුම්කරණ ප්‍රමිත, සමාගම් පනතේ විධිවිධාන පිළිබඳව අවබෝධය ලබා ගත යුතුය.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. නව LKAS ප්‍රමිත සම්බන්ධ දැනුම තව දුරටත් වර්ධනය කර ගත යුතුය.

3. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

4. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

5. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

6. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

7. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

8. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -